# ලංසු සඳහා ආරාධනයයි
# දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
# නිත්‍ය මගී සේවා බලපත්‍ර නිකුත් කිරීම

දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති විසින් දකුණු පළාතේ පොදු මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මහජන නියෝජිතයින්, බහුජන සංවිධාන හා මගී ඉල්ලීම් අනුව අධිකාරිය විසින් පරීක්ෂා කර, හදුනාගත් මාර්ග සඳහා සාමාන්‍ය / සුඛෝපභෝගී / දක්ෂිණ අධිවේගී මාර්ග හරහා සුඛෝපභෝගී නිත්‍ය මගී සේවා බලපත්‍ර 20 කට අදාල බලපත්‍ර නිකුත් කිරීමට යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. නිත්‍ය මගී සේවා බලපත්‍ර සඳහා ලංසු පිරිනැමීමේ අයිතිය අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතුය. ලංසු සඳහා ආරාධනා කරනු ලබන මාර්ග පහත පලකරනු ලබන අතර සෑම සේවාවක් සඳහාම පහත ලේඛනයේ සඳහන් අනුමත ආසන ධාරිතාවයෙන් යුතු බස්රථ ඉදිරිපත් කල යුතුය. ලංසුකරණය, ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය (NCB) ක්‍රමය යටතේ සිදු කරනු ලබයි.

- අධිකාරියේ බලපත්‍රධාරියෙක් හෝ පොරොත්තු ධාවකයෙක් එකී බලපත්‍රය වෙනුවට මෙම මාර්ග ලංසු ප්‍රදාන බලපත්‍රයක් ලබාගනී නම් ලබාගත හැකි සහන ලංසු ලේඛන වල කොන්දේසි යටතේ ඉදිරිපත් කර ඇත.
- සුඛෝපභෝගී හා දක්ෂිණ අධිවේගී මාර්ගයේ සුඛෝපභෝගී බලපත්‍ර සඳහා අයදුම්කල හැක්කේ අධිකාරියෙන් දැනට බලපත්‍ර ලබා ඇති ධාවකයන්ට පමණි.
- ලංසු සඳහා ආරාධනය කරනු ලබන සෑම මාර්ගයක් වෙනුවෙන්ම නියමිත කාලසටහන් හා ගාස්තු සටහන් සකස් කර ඇති අතර ලංසු ලේඛනය තුල අයදුම්පත්‍ර සමග කාලසටහන් විස්තර ලබා දෙනු ලැබේ.

ලංසු තැබීම මගින් ලබාදෙනු ලබන මාර්ග වල ගමනාන්ත අනෙකුත් සේවාවන්ට වන බලපෑම හා නීතිමය කරුණු මත දීර්ඝ කිරීමක් හෝ වෙනත් මාර්ග සඳහා සංශෝධනය කිරීමක් සිදු කරනු නොලැබේ. මෙම මාර්ගවල මගී අවශ්‍යතාවය මත සේවා තර කිරීමේදී ශ්‍රිලංගම සමග (60% - 40%) පදනම මත අනාගතයේ සේවා තර කිරීම සිදු කෙරේ. ඒ අනුව මාර්ග පරීක්ෂා කර සේවා පවත්වාගෙන යාමේ හැකියාව සලකා බලා පමණක් ලංසු වටිනාකම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමි.

## ලංසු තැබීම සඳහා ඉදිරිපත් කරනු ලබන මාර්ග විස්තර

### ලංසු ආරාධනය 01 (සාමාන්‍ය සේවා බලපත්‍ර)

| ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාව | ආපසු ගෙවන ඇප තැන්පතුව රු. |
|---|---|---|---|---|
| 2019/ADM/DEV/FI/02/01 | 762/2 | බද්දේගම - නුගේතොට - ඇත්කඳුර - ඇල්ල - ඇල්පිටිය | 42 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/02 | 395/1 | උනන්විටිය - පොල් කොරටුව හන්දිය - නාගොඩ - මාපලගම | 30/35 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/03 | 403/4 | නෙළුව - දනවල - පිංකන්ද - පොල්ගහවිල | 30/35 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/04 | 509/3 | ගාල්ල - යටගල - පැදින්නෝරුව | 30/35 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/05 | 416/1 | අකුරැස්ස - අතුරලිය - ගම්උදාව - කඹුරුපිටිය | 42 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/06 | 921 | මාවරල - කැටපලකන්ද - දෙයියන්දර | 42 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/07 | 558/1 | කිරින්ද - හෙට්ටියාවල - කරතොට - උඩුපිල්ලගොඩ - හක්මන | 30/35 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/08 | 338/5 | බෙංගමුකන්ද - රුක්මල්පිටිය - කටුවන - ජුලම්පිටිය - ගල්පොත්තයාය - මිද්දෙණිය | 30/35 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/09 | 338/4 | මිද්දෙණිය - ඕකන්දයාය- මීගස්ආර හන්දිය - වීරකැටිය | 30/35 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/10 | 515/7 | වලස්මුල්ල - තමාඩුව - පාලංකඩ - කඩවල - වීරකැටිය | 30/35 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/11 | 574/2 | අඟුණුකොලපැලැස්ස - උඩයාල - විතාරන්දෙනිය - රොටෙට - නෙටොල්පිටිය - තංගල්ල | 30/35 | 25,000.00 |

## ලංසු ආරාධනය 02 (සුඛෝපභෝගී බලපත්‍ර)

| ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාව | ආපසු ගෙවන ඇප තැන්පතුව රු. |
|---|---|---|---|---|
| 2019/ADM/DEV/FI/02/12 | 360 AC | දෙනියාය - මොරවක - අකුරැස්ස - මාතර | 33 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/13 | 363 AC | මිද්දෙණිය - වලස්මුල්ල - හක්මන - මාතර | 33 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/14 | 334/1AC | මාතර - දික්වැල්ල - බෙලිඅත්ත - තංගල්ල - හම්බන්තොට - තිස්සමහාරාම | 33 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/15 | 334/1AC | තිස්සමහාරාම - හම්බන්තොට - තංගල්ල - බෙලිඅත්ත - දික්වැල්ල - මාතර | 33 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/16 | 358 AC | දෙල්ලව - උඩුගම - කරාපිටිය - ගාල්ල | 33 | 25,000.00 |

## ලංසු ආරාධනය 03 (දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා සුඛෝපභෝගී බලපත්‍ර)

| ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාව | ආපසු ගෙවන ඇප තැන්පතුව රු. |
|---|---|---|---|---|
| 2019/ADM/DEV/FI/02/17 | 752 EX/AC | ඇල්පිටිය - ගාල්ල | 33 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/18 | 350 EX/AC | ගාල්ල - මාතර | 33 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/19 | 350 EX/AC | මාතර - ගාල්ල | 33 | 25,000.00 |
| 2019/ADM/DEV/FI/02/20 | 32/9 EX/AC | තංගල්ල - බෙලිඅත්ත - දික්වැල්ල - මාතර - ගාල්ල | 33 | 25,000.00 |

1. අභිලාෂී ලංසුකරුවන්හට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ඉහත සඳහන් එක් එක් ලංසු ආරාධනයන්හි වෙන් වෙන් වශයෙන් සඳහන් ලංසු සඳහා ආපසු ගෙවනු නොලබන රු.2,000/- ක ලංසුපත් ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2019 මාර්තු 05 වන දින සිට 2019 මාර්තු 19 දින දක්වා කාර්යාල දිනයන් තුල ප.ව 3.00 දක්වා ධාවන අංශයෙන් මිලදී ගත හැකිය.
2. අභිලාෂී යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු පහත සඳහන් දුරකථන අංකයට ධාවන අංශයට ඇමතීමෙන් ලබා ගත හැකි අතර, ලංසු ලිපි ලේඛන කාර්යාල වේලාව තුල අධිකාරියේදී නොමිලේ පරීක්ෂා කිරීම සිදු කල හැකිය.
3. වෙන් වෙන් වශයෙන් සඳහන් ලංසු සඳහා එක් ලංසුවකට රු.25,000/- බැගින් ආපසු ගෙවනු ලබන ඇප තැන්පතුවක් ඉදිරිපත් කල යුතුය.
4. ලංසු ඉදිරිපත් කලයුතු අවසාන දිනය 2019 මාර්තු මස 21 වන දින මධ්‍යාන 1200 පැය වන අතර එදින 1230 පැයට අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී ලංසු විවෘත කරනු ලැබේ.
5. නිසි පරිදි සම්පූර්ණ කර, මුද්‍රා තබන ලද ලංසු අනුපිටපතකින් යුක්තව ලියාපදිංචි තැපෑලෙන් ගාල්ල, කොටුව, ලේන්බාන් වීදිය, නො.67, දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ එවීම හෝ අධිකාරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම ලංසු ලබා ගන්නා අවසන් වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ සිදු කල යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. කවරයේ වම්පස ඉහළ කෙලවරේ "නිත්‍ය මගී සේවා බලපත්‍ර නිකුත් කිරීම-2019" යනුවෙන් සඳහන් කල යුතුය.
6. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා අනිවාර්යෙන්ම සහභාගී විය යුතු බව දැනුම් දෙනු ලැබේ. ඕනෑම ලංසුවක් පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

මූලික තොරතුරු දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සියළුම දිස්ත්‍රික් කාර්යාල වලින් හෝ අංක : 67, ලේන්බාන් විදිය, කොටුව, ගාල්ල ලිපිනයෙන් හෝ www.sprpta.lk වෙබ් අඩවියෙන් හා දුරකථන අංක 091- 2234237 / 091-2227073 මගින් විමසිය හැකිය.

ඩී. ටිරෝන් කපිල ද සිල්වා.
සභාපති,
දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,
ගාල්ල.
2019/02/28